සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	පෙරදිග සංගීතය I	කාලය நேரம் Time	පැය 03යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

■ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මගසරි, පමරිග, ...ආකෘතිය අනුව යෙදෙන ස්වර අභ්‍යාසයේ ඊලඟට යෙදෙන ස්වර හතර තෝරන්න.
(1) ධපමග (2) ධනිපම (3) ධපගම (4) ගමපධ

2. සම්පූර්ණ ජාතියට අයත් නොවන රාගය කුමක් ද?
(1) යමන් (2) බිලාවල් (3) කාෆි (4) භූපාලි

3. විකෘති ස්වර සහිත රාග දෙක ඇතුළත් වරණය තෝරන්න.
(1) කාෆි - හෙරවි (2) කාෆි - බිලාවල් (3) බිලාවල් - භූපාලි (4) යමන් - භූපාලි

4. කවුරුදෝ අර කවුළුවෙන්, පාරමිතා බල පූජිත යන රාගාශ්‍රිත සරල ගී සඳහා පාදක කරගත් රාගය
(1) බිලාවල් ය. (2) හෙරවි ය. (3) කාෆි ය. (4) භූපාලි ය.

5. ගාන්ධාරය සහ නිශාදය පිළිවෙලින් වාදී සහ සංවාදී ස්වර ලෙස යෙදෙන රාගය කුමක් ද?
(1) බිලාවල් (2) හෙරවි (3) කාෆි (4) භූපාලි

6. ගානසමය හා ථාඨය යන අංග සමාන රාග යුගලය තෝරන්න.
(1) යමන් - කාෆි (2) කාෆි - හෙරවි (3) යමන්- භූපාලි (4) බිලාවල් - හෙරවි

7. සරි ප්‍ර- මප්‍ර ධනි | ධප්‍ර මප්‍ර නිනි ස්‍ර-| වශයෙන් යෙදෙන තානාලංකාරය අයත් රාගය සහ තාන වර්ගය සඳහන් පිළිතුර තෝරන්න.
(1) කාෆි - මිශ්‍රතාන් (2) යමන් - සපට්තාන් (3) කාෆි - සපට්තාන් (4) බිලාවල් - මිශ්‍රතාන්

8. විවාදි ස්වර යෙදෙන රාග ඇතුලත් වරණය තෝරන්න.
(1) යමන් - භූපාලි (2) කාෆි - බිලාවල් (3) කාෆි - හෙරවි (4) යමන් - කාෆි

9. ..... ක අනුපිළිවෙලින් ආරෝහණ ස්වර හත පමණක් යෙදෙන අතර ..... ක ආරෝහණ අවරෝහණ ස්වභාව දෙකම ලියා දක්වනු ලැබේ. මෙහි හිස්තැන් සඳහා වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) රාගය - ථාඨය (2) ථාඨය - තානය (3) රාගය- තානය (4) ථාඨය - රාගය

10. ස්වර සැම යෙදෙනා කෝමල බැති සිරිගර රසපිරී යන ගීත පාදය අයත් රාගය හා ගීත වර්ගය සඳහන් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) බිලාවල් - ලක්ෂණ ගී (2) හෙරවි - බැති ගී
(3) හෙරවි - ලක්ෂණ ගී (4) බිලාවල් - බැති ගී

Past Papers Wiki

11. ධෛවතය සංවාදී ලෙස යෙදෙන නිර්දේශිත රාගයේ මුඛ්‍යාංගය වන්නේ
(1) ගරි ගප ධ- නිස්
(2) ගරි සධ සරිග
(3) නිරි ගරි ස
(4) සස රිරි ගග මම

12. "සවන් දී පෙර රාම චරිතේ අසව්" ගී පාදය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සමග්‍රහයෙන් ගැයෙන කාෆි රාගාශ්‍රිත නූර්ති ගීතයකි.
(2) විෂමග්‍රහයෙන් ගැයෙන භූපාලි රාගාශ්‍රිත සරල ගීතයකි.
(3) අවග්‍රහයෙන් ගැයෙන බිලාවල් රාගාශ්‍රිත සරල ගීතයකි.
(4) විෂමග්‍රහයෙන් ගැයෙන බිලාවල් රාගාශ්‍රිත නූර්ති ගීතයකි.

■ අංක 13 සිට 14 දක්වා ප්‍රශ්න සඳහා පහත ස්වර පාදය ඇසුරු කරගන්න.

සරි නිස ධනි | සරි ස- සරි නිස | ..... | සරි නිස ධනි සරි |
x 2 0 3

13. ඉහත ප්‍රස්තාරයෙහි සඳහන් තිහායි ස්වර කොටස සම්පූර්ණ වීමට හිස්තැනට සුදුසු නිවැරදි ස්වර වන්නේ
(1) සරි නිස ධනි
(2) ධනි සරි ස-
(3) සරි ස- ධනි
(4) ස- ධනි සරි

14. ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් තිහායි කොටස අයත් රාගය වන්නේ
(1) භෛරවි (2) කාෆි (3) බිලාවල් (4) භූපාලි

15. එම තිහායි කොටස ප්‍රස්තාර වී ඇති හින්දුස්ථානී තාලය කුමක්ද?
(1) දාදරා (2) ත්‍රිතාල් (3) දීප්චන්දි (4) කෙහෙර්වා

16. තබ්ලාවේ දායාං පමණක්, බායාං පමණක් සහ දෑතම භාවිතයෙන් යන ආකාර තුනෙන්ම අවනද්ධ අක්ෂර උපදවන නිර්දේශිත තාලය වන්නේ
(1) දාදරා (2) කෙහෙර්වා (3) ත්‍රිතාල් (4) ජප් තාල්

17. ජන සංගීතය පිළිබඳ තොරතුරු ඇතුළත් "ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය" සහ "හෙළ ගී මග" යන කෘතීන් නිර්මාණය කරන ලද කතෘන් පිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.
(1) ඩබ්.බී. මකුලොළුව - සුනිල්සාන්ත
(2) සී ද එස් කුලතිලක - ලයනල් රන්වල
(3) සී ද එස් කුලතිලක - ඩබ්.බී. මකුලොළුව
(4) ඩබ්.බී. මකුලොළුව - සී ද එස් කුලතිලක

18. කලවානේ ධර්මාලංකාර අතපත්තු මුදලිතුමා විසින් රචිත ගායන විශේෂය වන්නේ
(1) සබරගමු වන්නම් (2) පහතරට වන්නම් (3) උඩරට වන්නම් (4) හටන් කවි

19. ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගැමි ගී පාද දෙකක් පිළිවෙලින් සඳහන් නිවැරදි වරණය තෝරන්න.
(1) දොඩම් කපාලා - සරණයි සරණයි
(2) කළුවන් කළුරුවයි - අතට වෙරලු
(3) මනමත් කරවන - පැහැසරණිය මිණිපැමිණිය
(4) අතට වෙරලු - කළුවන් කළුරුවයි

20. ජන ගී නාදමාලා ආශ්‍රිතව තනු නිර්මාණය වූ "මල්සරා බැල්ම හෙළා" ගීතය පදරචනය, තනු නිර්මාණය හා ගායනය කරන ලද්දේ
(1) ලයනල් රන්වල මහතා ය.
(2) රෝහණ බැද්දගේ මහතාය.
(3) සුනිල් සාන්ත මහතා ය.
(4) වික්ටර් රත්නායක මහතා ය.

21. කවියක් ගීතයක් බවට පත්වූ අවස්ථාවක් නොවන්නේ මින් කුමක්ද?
(1) ලක්වැසියන් කෙරෙහි නැමී (2) රූ රැසේ අඳිනා ලෙසේ අත්
(3) මුණිසිරිපා සිඹිමින්නේ (4) දෑතට වළලු මල් මුතුවැල්

22. ග්‍රැමෆෝන් යුගයේ ගීතයක් සහ එහි ගායකයා / ගායිකාව නිවැරදිව සඳහන් වරණය තෝරන්න.
(1) බැස සීතල ගඟුලේ - සුනිල් ශාන්ත (2) ශ්‍රී රාහුල හිමිගේ නාමේ - එ.ච් ඩබ්. රූපසිංහ
(3) දසබල ධාරී - ආනන්ද සමරකෝන් (4) පිට දීප දේශ ජයගත්තා - රුක්මණී දේවි

23. ඩබ්.ඩී. අමරදේවයන් සංගීත අධ්‍යක්ෂණය කරන ලද චිත්‍රපට යුගලයකි.
(1) රන්මුතු දූව - ගැටවරයෝ (2) හුලවාලි - ගැටවරයෝ
(3) සැඩසුළං - රන්මුතු දූව (4) ගැටවරයෝ - සැඩසුළං

24. "චින්න චින ආසෙයි" යන ගීතය සඳහන් චිත්‍රපටය සහ සංගීතවේදියා නිවැරදිව සඳහන් වන පිළිතුර තෝරන්න.
(1) අභිමාන් - මොහොමඩ් ගවුස් (2) රෝජා - ආර්. මුත්තුසාමි
(3) අභිමාන් - රවි ශංකර් (4) රෝජා - ඒ.ආර්. රහුමාන්

25. මා ප්‍රියාදර ජයභූමි, ගලන ගඟකි ජීවිතේ, පිපී පිපී රේණු නටන, යන ගීත ඇතුලත් වන චිත්‍රපටය වන්නේ,
(1) රේඛාව (2) සැඩසුළං (3) ගැටවරයෝ (4) රනුමුතුදුව

26. හින්දි ගී අනුකරණයෙන් නිර්මාණය වූ ග්‍රැමෆෝන් ගීතයක් නොවන්නේ මින් කුමන ගීතයද?
(1) දුල් සලවනේ ලකල් (2) මහ බෝධිමුලේ
(3) මුණි නන්දන සිරිපාද වදිම් (4) සිරිබුද්ධගයා විහාරේ

■ අංක 27 සිට දක්වා ප්‍රශ්න සඳහා පහත වගුවේ ඇති ගී පද උපයෝගී කරගන්න.

A	B
1. පින්සරු ධීරා	4. බුදු තුල් ගුණැති සමිඳුනේ
2. යානත අතුල මල්පෙති	5. මෑ වේ මා දුටු කොමළලියා
3. ඒ බුදු බව පතමින ලොබිනේ	6. දස දෙස ඉන්ද්‍රා

27. ඉහත A සහ B ලෙස බාණ්ඩ වී ඇති ගී පද පිළිවෙලින්,
(1) නූර්ති සහ නාඩගම් ගී වේ. (2) නූර්ති හා නවනාට්‍ය ගී වේ.
(3) නාඩගම් හා නවනාට්‍ය ගී වේ. (4) නාඩගම් හා නූර්ති ගී වේ.

28. A - 1 හි සඳහන් ගී පාදයට අනුව තනු නිර්මාණය වී ඇති ගී පාදය වන්නේ
(1) B - 4 (2) B - 5 (3) B - 6 (4) A - 3

29. A-3 සහ B - 5 යන අංක වලින් දැක්වෙන ගී පාද අයත් නාට්‍යවල නම් සඳහන් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) මනමේ - සිංහබාහු (2) වෙස්සන්තර - මනමේ
(3) ඉයුජින් - වෙස්සන්තර (4) වෙස්සන්තර - සිංහබාහු

30. ප - මග | ප - - - | ·// මෙම ස්වර ඛණ්ඩය ඉදිරියේ ඇති Repitation Mark යෙදී ඇති ආකාරය අනුව වාදනය විය යුතු නිවැරදි පිළිවෙල වන්නේ
(1) ප - මග | ප - - - | - - - - | - - - - (2) ප - මග | ප - මග | ප - - - | ප - - - |
(3) ප - මග | ප - - - | ප - මග | ප - - - | (4) ප - මග | ප - - - | ප - - - | ප - - - |

31. අපරදිග සංගීතයේ එක් ස්කේලයක් (Scale) තුළ භාවිත කළ හැකි Major Chords ගණන කීයද?

(1) 2කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

32. E මයිනර් ස්කේලයට (E^m Scale) අයත් ෂාප් ස්වර (Sharp Note) සංඛ්‍යාව

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි.

■ පහත සඳහන් වේදිකා නාට්‍ය ගී පාද ඇසුරින් ප්‍රශ්න අංක 33 සිට 35 දක්වා පිළිතුරු සපයන්න.

(A) පළමුව මම වැන්ද බුදුන් (B) රස බොජුනක් නැතත්

(C) අප මුණිසඳ එර්දි බලෙන් (D) අපි කිරිල්ලියෝ

33. ජැක්සන් ඇන්තනී සහ අනුලා බුලත්සිංහල රංගනයෙන් දායක වන ජැංඩි සිංඤෝ සහ රෝස නෝනාගේ චරිත නිරූපණය කරන විරිදු පන්තිය සඳහන් ගීත පාදය වන්නේ,

(1) A (2) B (3) C (4) D

34. B අක්ෂරයට හිමි ගී පාදය අයත් නාට්‍ය සහ නිෂ්පාදන සඳහන් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) මධුර ජවනිකා - දයානන්ද ගුණවර්ධන (2) අබුද්දස්ස කෝලම - ලූෂන් බුලත්සිංහල

(3) අන්දරේලා - ජයලත් මනෝරත්න (4) අන්දරේලා - රෝහණ බැද්දගේ

35. ජයසේකර අපොන්සුගේ "තටු" වේදිකා නාට්‍යයේ සඳහන් වන ගීතය වන්නේ,

(1) A (2) B (3) C (4) D

■ අංක 36 සිට 37 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් තාලපද උපයෝගී කරගන්න.

A - දො දො ං ත | ත කු දො ං

B - ධ ගෙ න ති | න ක ධි න

C - දි කු ං තා | - කු දො ං

36. "පායාලා අඹරේ" සහ "අප ගුණසරු සිංහල" යන ගීත වර්ග සඳහා වාදනයට සුදුසු තාල පද පිළිවෙලින්

(1) A සහ B (2) A සහ C (3) C සහ B (4) B සහ C

37. A අක්ෂරයෙන් දැක්වෙන අවනද්ධ පදයට අනුව ගැයෙන්නේ,

(1) උකුසා වන්නම (2) කෝකිල වන්නම (3) සිංදු වන්නම (4) වෛරෝඩි වන්නම

38. කෝඩ්ස් (Chords) වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩ පමණක් සඳහන් පිළිතුර තෝරන්න.

(1) ඕගන් / ගිටාර් / වයලින් (2) ගිටාර් / මෙලෝඩිකා / මැන්ඩලින්

(3) රෙකෝඩර් ෆ්ලූට් / ගිටාර් / ඕගන් (4) ගිටාර් / එකෝඩියන් / ඕගන්

39. Logic Pro, Cubase, Protools වැනි මෘදුකාංග භාවිතයෙන් එක් එක් භාණ්ඩයේ හඬ වෙන වෙනම පටිගත කිරීම හඳුන්වන්නේ,

(1) MIDI (2) Multi track Recording

(3) E Music Recording (4) Key Board Music Recording

40. බටහිර සංගීතඥ ලුඩ්විග් වැන් බීතෝවන් විසින් නිර්මාණය කරන ලද සංධ්වනි ඇතුලත් නිවැරදි වරණය තෝරන්න.

(1) එරොයිකා - පැස්ටරෝල් (2) ප්‍රාග් - ජුපිටර්

(3) ඇක්‍රොපොලිස් - ට්‍රිබියුට් (4) කෝරල් - ජුපිටර්

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11	පෙරදිග සංගීතය - II	කාලය / நேரம் / Time

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

01. i. බිලාවල් රාගයේ අනුවාදී ස්වර ලියන්න.

ii රාත්‍රී තුන්වන/දෙවන ප්‍රහරය ලෙස ගානසමය නියමිතව ඇති රාගය නම් කරන්න.

iii නිර්දේශිත තාල අතුරෙන් බලි ස්ථානය අටවන මාත්‍රාවෙහි යෙදෙන හින්දුස්ථානී තාලය නම් කරන්න.

iv. C Minor Scale අයත් ස්වර නිවැරදිව ලියා දක්වන්න.

- අංක (v) සිට (x) තෙක් ඇති ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර ප්‍රශ්න අංකය සමඟ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

v. "රී රසේ අදිනා ලෙසේ අත් ලෙලදිදී විදුලිය පබා"
පැදි පාදයට අයත් සැදැස්මත් සංඛ්‍යාව ..... කි.

vi. "ගල්ලෙන බිඳලා ලෙන්දොර හැරලා" ගීතය ඇතුළත් නවනාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ ..... සූරීන් විසිනි.

vii ගුවන්විදුලියේ පටිගත කළ මුල්ම සිංහල ගීතය වන "ඕලු පිපීලා විල ලෙලදෙනවා" ගීතය ගායනය කරනුයේ ..... සූරීන් විසිනි.

viii ඛමාජ් රාගාශ්‍රිතව නිර්මාණය වූ "තෙරේ මේරේ මිලනකී" ..... චිත්‍රපටයේ ගීතයකි.

xi සුප්‍රසිද්ධ ඉන්දියානු සංගීතඥයින් වන ශකීර් හුසේන් දක්ෂ (a) .....
වාදකයෙකු වන අතර හරි ප්‍රසාද් චෞරසියා දක්ෂ (b) ..... වාදකයෙකි.

x මහාචාර්ය සිරි ගුණසිංහයන් අධ්‍යක්ෂණය කරන ලද
(a) ..... චිත්‍රපටයේ එන සිනිඳු සුදුමුතු තලාවේ ගීතය
(b) ..... විසින් ගයනු ලැබීය. (ල 12)

PAST PAPERS WIKI

Past Papers Wiki

02. පහත සඳහන් වනුයේ නිර්දේශිත රාග තුනකට අදාල ස්වර සංගතීන්ය.

* ස්ස්ධප ගරිස -	* පරි ගරිනිරිස -
* ගපධනිස් -	* පධ, සරිගපග -
* ගගරිස, නිරිස -	* මගමරි, සරිස -

i. ඉහත ස්වර සංගතිවලින් පිළිබිඹු වන රාග තුන නම් කර, අදාළ සංගති රාගය ඉදිරියේ ලියන්න.
(රාග තුනට 3යි / සංගති සඳහා ලකුණු 1/2 බැගිනි. (ල 6)

ii ඉන් ඔබ කැමති රාගයකට අයත් මධ්‍යලයේ ඛ්‍යාල් ගීතයක හෝ ලක්ෂණ ගීතයක අන්තරා කොටසක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල 4)

iii ඔබ (ii) කොටසේ ප්‍රස්තාර කළ රාගය හැර ඉතිරි රාග දෙකෙන් කැමති රාගයකට මාත්‍රා 08 කට නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ල 2)

03. A - උතුම් වෙසක් පෝ දිනයේ - බණ කියන්න සාදු .....
B - නංවමු හෙළ අභිමානය පතුරා - සිරිලක මව්තුරුලේ වැජඹී ....

i ඉහත ගී පාද දෙක එහි ගති ලක්ෂණය අනුව පද ප්‍රස්තාර කරන්න. (ල. 4)
ii ඉහත A සහ B ගී පාද ගායනයට සුදුසු හින්දුස්ථානී තාල දෙක නම් කරන්න. (ල. 4)
iii ඉන් එක් තාලයක් නියමිත තාල සංඥා අනුව ප්‍රස්තාර කරන්න. (ල. 4)

04. පහත සඳහන් වනුයේ නිර්දේශිත කවිපාදයන් හා තිත් රූප කීපයකි.

A	සේවිත පාද සරෝරුහ සංජිත	*	සුළු තනි තිත
B	රන් දැකැති ගෙන නිති සැරසෙනවා	*	මැදුම් තනි තිත
C	බුද්ධං සරණේ සිරස දරාගෙන	*	මහ තනි තිත
D	මෝරා බීජයෙනා	*	මැදුම් මහ දෙතිත

i. ඉහත අක්ෂර වලින් දැක්වෙන කවි පාදවලට ගැළපෙන තිත් රූප තෝරා ලියන්න. (ල. 4)
ii. ඉහත සඳහන් කවිපාද, ගැමි ගී හා සේගී ලෙස වෙන්කර ලියා දක්වන්න. (ල. 4)
iii ගැමි ගී හා සේගී පිළිබඳ කරුණු 2ක් සන්සන්දනාත්මකව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

05. පහත දැක්වෙනුයේ නිර්දේශිත රංග සම්ප්‍රදායන් පිළිබඳ කරුණු හතරකි.

A උඩරට ප්‍රදේශයේ ප්‍රචලිතය.

B පහතරට ප්‍රදේශයේ ප්‍රචලිතය.

C දක්ෂිණ භාරතීය සංගීතය ඇසුරු කරයි.

D උත්තර භාරතීය සංගීතය ඇසුරු කරයි.


i. A, B, C, D අක්ෂරයන්ට අදාළ රංග සම්ප්‍රදායන් හතර නම් කරන්න. (ල. 4)

ii. එම ගීත සඳහා වාදනයට සුදුසු අවනද්ධ වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ල. 4)

iii. පහත ගීත අයත්වන නාට්‍යවල නම් සහ එම නාට්‍ය නිෂ්පාදකවරුන්ගේ නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න. (ලකුණු 1/2 බැගින් 4)

නාට්‍ය ගීතය	නාට්‍යයේ නම	නිෂ්පාදක
අහෝ දුක වාවන්ට බෑ	(a)	(b) .....
ප්‍රේමයෙන් මන රංජිත වේ.	(c)	(d) .....
ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්	(e)	(f) .....
ලෝනා මුණිරාජගේ	(g)	(h) .....

06.



i. ඉහත සඳහන් අපරදිග ප්‍රස්තාරය අයත් scale හා ප්‍රස්තාරයට සුදුසු time signature නම් කරන්න. (ල. 4)

ii ඉහත දැක්වෙන අපරදිග ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට අනුව ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 4)

iii a, b, c, d අක්ෂර වලින් පෙන්වා ඇති සංකේත නම් කරන්න. (ල. 4)

07. පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් තෝරාගෙන කෙටියෙන් විස්තර කරන්න. (එක් මාතෘකාවකට කරුණු හතරක් සෑහේ)

I. මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා නිර්මාණකරුවන්ගේ දායකත්වය

ii. සිංහල චිත්‍රපට කලාවේ උන්නතියට රේඛාව චිත්‍රපටයේ බලපෑම

iii. පරිගණකය සංගීත නිර්මාණයට සහ සංගීත අධ්‍යාපනයට ප්‍රයෝජනවත් මෙවලමක් ලෙස වැදගත්වීම.

iv. යාති සංගීතඥයාගේ සංගීතමය මෙහෙවර

(ල. 4x3)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank